 12724

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

33 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ඉතිහාසය I
வரலாறு I
History I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **80** ක් හිමි වේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** අතීතය, වර්තමානය හා අනාගතය අතර සම්බන්ධතාව තුළින් ඉතිහාසය යනු කුමක්දැයි නිර්වචනය කිරීමට උත්සාහ දැරූ ඉතිහාසඥයා ලෙස සැලකෙනුයේ,
(1) ජවහර්ලාල් නේරු ය. (2) වින්ස්ටන් චර්චිල් ය. (3) ඊ.එච්. කාර් ය. (4) ජී.එම්. ට්‍රෙව්ලියන් ය.

**2.** පහත දැක්වෙන තොරතුරු අදාළ වන්නේ ශ්‍රී ලංකාවේ කවර මූලාශ්‍රයක් සම්බන්ධයෙන් ද?
- පැරණිතම වංසකතාව වීම
- තොරතුරු කෙටියෙන් දක්වා තිබීම
- ක්‍රි.ව. හතරවන ශත වර්ෂයේදී පමණ ලියැවී තිබීම

(1) බෝධිවංසය. (2) ථූපවංසය. (3) දීපවංසය. (4) මහාවංසය.

**3.** මෙරට ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන තොරතුරු ගොඩ නගා ගැනීමට ඉවහල් වන මූලාශ්‍රය කුමක් ද?
(1) ජන කථා (2) ශිලා මෙවලම් (3) වංශ කථාවල තොරතුරු (4) ගොඩනැගිලි නටබුන්

**4.** උඩරට දේශපාලන, ආර්ථික හා සමාජ තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් සම්පාදනය කළ විදේශිකයා වන්නේ,
(1) පාහියන් හිමි ය. (2) ක්වේරෝස් පියතුමා ය. (3) ප්‍රකෝපියස් ය. (4) රොබට් නොක්ස් ය.

**5.** අනුරාධපුර යුගයේ මුල් භාගයේදී බහුලව දක්නට ලැබෙනුයේ කවර වර්ගයේ සෙල්ලිපි ද?
(1) ලෙන් ලිපි (2) ගිරි ලිපි (3) ටැම් ලිපි (4) පුවරු ලිපි

**6.** ශ්‍රී ලංකාව ගැන ද තොරතුරු ඇතුළත් කොට ඉන්ඩිකා නමැති ග්‍රන්ථය ලියූ චන්ද්‍රගුප්ත රජුගේ ග්‍රීක තානාපතිවරයා වන්නේ,
(1) ප්ලිනි ය. (2) ටොලමි ය. (3) මෙගස්තිනිස් ය. (4) ඉබන් බතුතා ය.

**7.** වංශ කථා අනුව, විජය ඇතුළු පිරිස තම ජනපද සඳහා තෝරා ගත් ගංගාධාර දෙකක් වනුයේ,
(1) කැලණි ගඟ හා වලවේ ගඟ ය. (2) මල්වතු ඔය හා කලා ඔය ය.
(3) ගල්ඔය හා යාන් ඔය ය. (4) මහවැලි ගඟ හා කිරිඳි ඔය ය.

**8.** ගම්භීර නදිය ආශ්‍රිතව ජනාවාසයක් පිහිටවූ විජය රජුගේ ඇමතිවරයා
(1) අනුරාධ ය. (2) විජිත ය. (3) උපතිස්ස ය. (4) උරුවේල ය.

**9.** පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඒවා සිදු වූ අනුපිළිවෙල අනුව පෙළ ගැස්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?
A – කන්තලේ හා ගිරිතලේ වැව් ඉදි කිරීම
B – ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම
C – පරාක්‍රම සමුද්‍රය ඉදි කිරීම
D – ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

(1) B, D, A, C (2) D, B, A, C (3) B, C, D, A (4) D, A, C, B



Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**10.** අනුරාධපුර මුල් යුගයේ ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් අතර පැවති සම්බන්ධතාවයේ කැපී පෙනෙන ලක්ෂණය වූයේ,
(1) ආක්‍රමණ සිදුවීම ය. (2) සංක්‍රමණ සිදුවීම ය.
(3) වෙළෙඳ දූත ගමන් සිදුවීම ය. (4) සංස්කෘතික දූත ගමන් සිදුවීම ය.

**11.** විවිධ බාහිර බලපෑම්වලට නතු වුව ද ශ්‍රී ලංකාවට සුවිශේෂී වූ අනන්‍යතාවයක් ගොඩ නගා ගැනීමට හැකි වී ඇත්තේ,
(1) ඉන්දියාවට සමීපව පිහිටීම ය. (2) අතීත මුහුදු සේද මාවතේ මධ්‍යස්ථානයක් ව පිහිටීම ය.
(3) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම ය. (4) දූපතක් ලෙස පිහිටීම ය.

**12.** ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පදිංචි ව කෘෂිකර්මය ජීවනෝපාය ලෙස තෝරා ගත් මුල් ආර්ය ජනපදිකයන්ට මුහුණපෑමට සිදු වූ ප්‍රධානතම අභියෝගය කුමක් ද?
(1) නව ජනාවාස සඳහා වනාන්තර එළි කිරීමට තිබූ අපහසුතාවය
(2) ලැබුණු වර්ෂාපතනයේ අවිනිශ්චිතභාවය නිසා ආහාර නිෂ්පාදනයට අවහිර ඇති වීම
(3) වියළි කලාපයේ දේශගුණය ජනපදිකයන්ට හුරු නොවීම
(4) අලුත් පරිසර තත්ත්වය තම ජීවනෝපායට එතරම් යෝග්‍ය නොවීම

**13.** අනුරාධපුර යුගයේ දී ඉන්දියාවේ මෙන් උග්‍ර කුල භේදයක් දක්නට **නොලැබීමට** හේතුව වන්නේ,
(1) රජවරු රටවැසි සියලුදෙනාටම එකසේ සැලකීම ය.
(2) රටවැසියාට කුල ක්‍රමය පිළිබඳ අවබෝධයක් නොතිබීම ය.
(3) ජනතාව කිසිදු භේදයකින් තොරව එක්සත්ව වාසය කිරීම ය.
(4) බුදු දහමේ ඉගැන්වීම් සමාජය තුළ පැතිරයාම ය.

**14.** මෙරට නිකාය භේදය ආරම්භ වීමට පදනම් වූ ආරාම දෙකක් වන්නේ,
(1) මහාවිහාරය සහ ථූපාරාමයයි. (2) අභයගිරිය සහ ජේතවනාරාමයයි.
(3) තිස්සමහාරාමය සහ ලංකාරාමයයි. (4) මිරිසවැටිය සහ උත්තරාරාමයයි.

**15.** පහත **I** තීරුවේ ශ්‍රී ලංකාවේ සුවිශේෂ වැව් කිහිපයක් ද **II** තීරුවේ ඒවායේ සුවිශේෂත්වයට පදනම් වූ හේතු ද දැක් වේ.

| **I තීරුව** | **II තීරුව** |
|---|---|
| (i) අභය වැව | A - වැව් කිහිපයක් ඒකාබද්ධ කොට නිර්මාණය කිරීම |
| (ii) තිසා වැව | B - නාගරික ජල අවශ්‍යතාවන්ට මුල් තැන දී නිර්මාණය කිරීම |
| (iii) පරාක්‍රම සමුද්‍රය | C - කඳු රහිත ප්‍රදේශයක චාපාකාර බැම්මක් යොදා නිර්මාණය කිරීම |
| | D - රාජ්‍ය අනුග්‍රහය යටතේ ඉදි කළ පළමු වැව වීම |

**I** තීරුව සමග **II** තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) D, B සහ A (2) B, C සහ D (3) B, D සහ A (4) C, B සහ A

**16.** වැව් බැම්මෙන් ජලය කාන්දු වීම වැලක්වීම සඳහා ක්වාට්සයිට් ස්ථරයක පිහිටීම සැලකිල්ලට ගෙන නිර්මාණය කළ වැවකට නිදසුනක් වන්නේ,
(1) පදවිය වැව ය. (2) නාච්චදූව වැව ය. (3) මින්නේරිය වැව ය. (4) ගිරිතලේ වැව ය.

**17.** ක්‍රි.ව. පස්වන සියවසේ සිටි රජවාසල කාන්තාවන්ගේ විලාසිතා ගැන අවබෝධයක් ලබා ගැනීමට ඉවහල් වේයැයි සැලකිය හැක්කේ,
(1) පුරාවිද්‍යාත්මක කැණීම්වලින් හමුවූ ආභරණ ය. (2) පොළොන්නරුවේ තිවංක පිළිමගේ චිත්‍ර ය.
(3) දෙගල්දොරුව විහාර චිත්‍ර ය. (4) සීගිරි ලලනා රූප ය.

**18.** පහත සිදුවීම් අතරින් දඹදෙණි රාජ්‍ය සමයේ ලංකාවට පැමිණි සංචාරකයකුට අසන්නට **නොලැබෙන** සිද්ධීන් දැක්වෙන පිළිතුර කුමක් ද?
A – කාලිංග මාඝ ආක්‍රමණය B – දුටුගැමුණු එළාර සටන
C – චෙංහෝ සෙනවියාගේ ආක්‍රමණය D – මින්නේරි වැව ඉදි කිරීම
E – යාපන පාලකයා ලෙස සපුමල් කුමරු පත් කිරීම
(1) C සහ E (2) A සහ E (3) A සහ C (4) B සහ D

**19.**
- ශිලාලිපි මගින් කාලිංග වංශයේ උසස් බව හුවා දැක්වීම
- තුලාභාර දාන දීම
- රටවැසියන්ට බදු සහන ලබා දීම

ඉහත තොරතුරු හා සම්බන්ධ පොළොන්නරු පාලකයා කවුරුන් ද?
(1) පළමුවන විජයබාහු රජ (2) සාහසමල්ල රජ
(3) පළමුවන පරාක්‍රමබාහු රජ (4) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජ

[තුන්වැනි පිටුව බලන්න.
Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**20.** පහත A සිට D දක්වා ඇති තොරතුරු අදාළ වන්නේ කිනම් රාජධානියකට ද?

A – අග නගරය වීමට පෙර උපනගරයක්ව පැවතීම

B – ශ්‍රී පාද මාර්ගයේ සන්ධිස්ථානයක පිහිටීම

C – මහවැලි ගඟ ගලා බසින නිම්නයේ පිහිටීම

D – කඳු කිහිපයකින් වටවූ තැනිතලා බිමක පිහිටා තිබීම

(1) යාපහුව (2) කුරුණෑගල (3) ගම්පොළ (4) දඹදෙණිය

**21.** පහත ප්‍රකාශ අතරින් යාපනය රාජ්‍යය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) යාපනය රාජ්‍යයේ අගනුවර නල්ලූර් ය.

(2) යාපනය රාජ්‍යය විජය නගර් අධිරාජ්‍යයට යටත්ව තිබූ බව දකුණු ඉන්දීය මූලාශ්‍රවල දැක් වේ.

(3) පෘතුගීසිහු කුරුඳු ලබා ගැනීමට යාපනය රාජ්‍යය කෙරෙහි අවධානය යොමු කළ හ.

(4) වල්ලිපුරම් රන් සන්නසින් යාපනයේ අතීත තොරතුරු හෙළි වේ.

**22.** වෙළෙඳාමත්, ආගම පැතිරවීමත් මුල්කොට ගෙන ඉන්දියන් සාගර කලාපයට පැමිණි මුල්ම යුරෝපීය ජාතිය වූයේ,

(1) ප්‍රංශයන් ය. (2) පෘතුගීසීන් ය. (3) ඕලන්දයන් ය. (4) ඩේන්ස්වරුන් ය.

**23.** උඩරට රාජධානියේ බලය ලබා ගැනීම සඳහා පෘතුගීසීන් පහත කවර ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට උත්සාහ ගත්තේ ද?

(1) භික්ෂූන් වහන්සේලාගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම

(2) කතෝලික ආගම උඩරට ප්‍රදේශවල ප්‍රචාරය කිරීම

(3) කොනප්පු බණ්ඩාරට උඩරට රජකම ලබා දීමට සහාය වීම

(4) උඩරට සිංහාසනයට උරුමයක් තිබුණු කුසුමාසන දේවිය රජ කර වීම

● පහත A, B, C හා D වලින් උඩරට රජවරුන් හා ලන්දේසින් අතර ඇතිවූ ගිවිසුම් පිළිබඳ තොරතුරු දැක්වේ. ඒවා අධ්‍යයනය කොට **24** සහ **25** යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | රජතුමා | ගිවිසුම් වගන්තිය |
|---|---|---|
| 1638 | A - කීර්ති ශ්‍රී රාජසිංහ | C - පෘතුගීසින් පලවා හැරීමට ලන්දේසින් රජුට උදව් විය යුතු ය. |
| 1766 | B - දෙවන රාජසිංහ | D - මුහුදුබඩ ගව්වක් පළල බිම් තීරුවක් ලන්දේසින්ට පැවරිය යුතු ය. |

**24.** 1638 උඩරට ලන්දේසි ගිවිසුම හා සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර වන්නේ,

(1) B හා C ය. (2) A හා C ය. (3) B හා D ය. (4) A හා D ය.

**25.** 1766 උඩරට ලන්දේසි ගිවිසුම හා සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර වන්නේ,

(1) A හා C ය. (2) B හා D ය. (3) A හා D ය. (4) B හා C ය.

● පහත A, B, C හා D හි ඇත්තේ උඩරට රාජ්‍යය හා සම්බන්ධ ඓතිහාසික තොරතුරු කිහිපයකි. ඒවා ඇසුරෙන් **26** සහ **27** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – නායක්කර් වංශයට උඩරට රජකම හිමි වීම

B – කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස උඩරට සියම් නිකාය ඇරඹීම

C – පළමුවන රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කිරීම

D – කුසුමාසන දේවිය දෝන කතිරිනා නමින් බෞතිස්ම ලැබීම

**26.** ඉහත සිදුවීම්වල නිවැරදි ඓතිහාසික අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) D, A, C, B (2) C, D, A, B (3) C, A, D, B (4) D, C, A, B

**27.** A අක්ෂරයෙන් දැක්වෙන ඓතිහාසික සිදුවීම හා සම්බන්ධ රජතුමා කවුරුන් ද?

(1) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ

(2) රාජාධිරාජසිංහ

(3) ශ්‍රී විජය රාජසිංහ

(4) කීර්ති ශ්‍රී රාජසිංහ

/හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

● පහත A සිට F තෙක් තොරතුරු ඇසුරින් **28** සහ **29** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| බලපෑ හේතුව | නායකයා | ආණ්ඩුකාරවරයා |
|---|---|---|
| A - රජයේ අදූරදර්ශී බදු ප්‍රතිපත්තිය | C - කැප්පෙටිපොල දිසාව | E - ටොරින්ටන් සාමි |
| B - රදළවරුන්ගේ වරප්‍රසාද අහිමිවීම | D - ගොංගාලෙගොඩ බණ්ඩා | F - රොබර්ට් බ්‍රවුන්රිග් |

**28.** ක්‍රි.ව. 1818 නිදහස් සටන හා සම්බන්ධ තොරතුරු වන්නේ,
(1) B, D හා F ය. (2) A, C හා F ය. (3) A, D හා E ය. (4) B, C හා F ය.

**29.** ක්‍රි.ව. 1848 නිදහස් සටන හා සම්බන්ධ තොරතුරු වන්නේ,
(1) B, D හා F ය. (2) A, D හා E ය. (3) B, C හා E ය. (4) A, C හා E ය.

**30.** ක්‍රි.ව. 1848 දී ආරම්භ වූ බ්‍රිතාන්‍ය විරෝධී අරගලයේ ප්‍රතිඵලයක් ලෙස මෙරට ගැමි ජනතාවගේ යහපත උදෙසා බ්‍රිතාන්‍ය පාලකයන් ගත් වැදගත් ම ක්‍රියාමාර්ගය කුමක් ද?
(1) මෙරට ධනවතුන්ට ව්‍යාපාර ඇරඹීමට උදව් දීම (2) ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා පාසල් සංඛ්‍යාව වැඩි කිරීම
(3) ගැමි කෘෂිකර්මය දියුණු කිරීමට කටයුතු කිරීම (4) දිවයිනේ ප්‍රධාන නගර මහාමාර්ගවලින් සම්බන්ධ කිරීම

**31.** පහත දක්වා ඇති තොරතුරු අතරින් සමස්ත ශ්‍රී ලංකාව ම එකම ඡන්ද කොට්ඨාශයක් බවට පත්වන අවස්ථා මොනවා ද?
A – ජනාධිපතිවරණය B – පළාත් සභා මැතිවරණය
C – ප්‍රාදේශීය සභා මැතිවරණය D – ජනමත විචාරණය
E – මහ මැතිවරණය
(1) B සහ D (2) A සහ D (3) C සහ E (4) A සහ E

**32.** ඍග් වෛදික ආගමික ඇදහීම්වල විශේෂ ලක්ෂණයක් වූයේ,
(1) භාවනාව හා තපස් රැකීමට මුල් තැන දීම ය. (2) ත්‍රිමූර්තියට වන්දනා කිරීම ය.
(3) මාතෘ දෙවඟනට වන්දනා කිරීම ය. (4) ස්වාභාවික වස්තූන් දේවත්වයෙන් සැලකීම ය.

**33.** අශෝක අධිරාජයාගේ දේශපාලන ප්‍රතිපත්තියේ පරිවර්තනයක් ඇතිවීමට පාදක වූ ප්‍රබල ම හේතුව වන්නේ,
(1) මොග්ගලීපුත්ත තිස්ස තෙරුන්වහන්සේගේ අවවාද අනුශාසනා ලැබීමයි.
(2) ධර්ම මහා මාත්‍රවරුන්ගෙන් ලද මඟ පෙන්වීමයි.
(3) කාලිංග සටනින් සිදු වූ අතිමහත් ජීවිත විනාශයයි.
(4) බුදු දහම වැළඳ ගැනීම නිසා ඇතිවූ ධර්මිෂ්ට ප්‍රතිපත්තියයි.

**34.** යුරෝපයේ පැවති වැඩවසම් පාලන ක්‍රමය තුළ වැඩි වරප්‍රසාද භුක්ති විඳින ලද්දේ,
(1) රජතුමා ය. (2) රදළවරු ය. (3) නයිට්වරු ය. (4) ආගමික පූජකවරු ය.

**35.** ලොව ඉමහත් කීර්තියක් ඉසිලූ නාලන්දා සහ වලභි විශ්ව විද්‍යාල දියුණුවට පත්වූයේ,
(1) ඍග් වෛදික යුගයේ දී ය. (2) පශ්චාත් වෛදික යුගයේ දී ය.
(3) මෞර්ය අධිරාජ්‍ය යුගයේ දී ය. (4) ගුප්ත අධිරාජ්‍ය යුගයේ දී ය.

**36.** දිල්ලි සුල්තාන් අධිරාජ්‍යයේ ආරම්භක පාලකයා වූයේ,
(1) කුටුබ්-උද්දීන්-අයිබෙක් ය. (2) අලා-උද්දීන්-ඛල්ජි ය.
(3) මොහොමඩ්-බින්- ටුග්ලුක් ය. (4) මහා අක්බාර් ය.

**37.** ජපානයේ පැවති වැඩවසම් ක්‍රමය අහෝසි කරන ලද්දේ,
(1) ටොකුගාවා ඉයාසු විසිනි. (2) නොබුනගා විසිනි.
(3) හිදෙයෝෂි විසිනි. (4) මුට්සුහිතෝ අධිරාජයා විසිනි.

**38.** 'ධනවාදය' ලොව පුරා ව්‍යාප්තකරලීමට උපකාරී වූ රාජ්‍ය නිර්බාධවාදය නමැති දර්ශනය ඉදිරිපත් කරන ලද්දේ,
(1) කාල් මාක්ස් විසිනි. (2) ජෙරමි බෙන්තම් විසිනි.
(3) ජෝන් ස්ටුවර්ට් මිල් විසිනි. (4) ඇඩම් ස්මිත් විසිනි.

**39.** ක්‍රි.ව. 1857 ඉන්දියානු සිපෝයි කැරැල්ලේ වැදගත් ම ප්‍රතිඵලය වූයේ,
(1) බ්‍රිතාන්‍ය වෙළෙඳ සමාගම් පාලනය අවසන්කොට ඉන්දියාව බ්‍රිතාන්‍ය කිරීටය යටතට පත් කිරීමයි.
(2) ඉන්දියානු ජාතික කොංග්‍රසය බිහිවීමයි.
(3) ඉන්දියානුන් තුළ දේශාභිමානි හැඟීම් වර්ධනය වීමයි.
(4) බ්‍රිතාන්‍යයන් ඉන්දියාවට නිදහස ලබා දීමයි.

**40.** ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති වුඩ්රෝ විල්සන් මහතාගේ මූලිකත්වයෙන් පිහිටුවා ගන්නා ලද්දේ,
(1) ජාතීන්ගේ සංගමයයි. (2) එක්සත් ජාතීන්ගේ සංවිධානයයි.
(3) නේටෝ සංවිධානයයි. (4) වෝර්සෝ සංවිධානයයි.

***

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

OL/2017/33-S-II (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

33 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ඉතිහාසය II
வரலாறு II
History II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

* I කොටසේ **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* II කොටසින් ප්‍රශ්න **තුනකට** ද, III කොටසින් ප්‍රශ්න **දෙකකට** ද පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

## I කොටස

1. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර, නම් කරන්න.


(i) යෝධ වැව, ගාල්හ නදී, පුලතිසිපුර, දඹකොලපටුන, කචරගාම, මහ කනදරා වැව, මහියංගනය, රිටිගල, කිරින්ද, මඩකලපු නගරය (ලකුණු 10 යි)

(ii) පර්සියන් බොක්ක, තාම්‍රලිප්ති, හිමාලයා කඳු, රෝමය, ජාවා දූපත, රතු මුහුද, ලිස්බන්, ජෙරුසලම (ලකුණු 08 යි)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන්/ස්ථාන කවුරුන් ද'යි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ඉතිහාසයේ පළමුවරට ක්ෂත්‍රිය අභිෂේකයක් සිදු කළ ශ්‍රී ලාංකික රජතුමා
B - ලියනාඩෝ ඩාවින්චි විසින් අඳින ලද ලෝක ප්‍රකට කාන්තා චිත්‍රය
C - විජය ඇතුළු ආර්ය කණ්ඩායම ශ්‍රී ලංකාවට ගොඩබට ප්‍රදේශය
D - රුහුණු රාජ්‍යයේ අගනුවර (ලකුණු 04 යි)

● A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



A

(ii) 1. 'A' වලින් දැක්වෙන නිර්මාණයේ නම කුමක් ද?
2. මෙය ගොඩ නංවන ලද රජතුමා අයත් රාජ වංශය කුමක් ද?
3. ඉන්දියාවේ කවර ගංගාවක් අසබඩ මෙය ගොඩ නංවා තිබේ ද?
4. කවරකු සැමරීම සඳහා මෙය ගොඩ නගා ඇත්තේ ද? (ලකුණු 04 යි)



B

(iii) 1. 'B' පින්තූරයේ දැක්වෙන ශ්‍රී ලාංකික රාජතාන්ත්‍රිකයාගේ නම කුමක් ද?
2. මෙතුමා ආරම්භ කළ දේශපාලන පක්ෂය සඳහන් කරන්න.
3. මෙතුමා, ශ්‍රී ලංකාවේ කවර ආණ්ඩුක්‍රමයක් යටතේ අගමැතිවරයා ලෙස කටයුතු කළේ ද?
4. මෙතුමාගේ අදහසක් අනුව ඇරඹූ බහු කාර්ය යෝජනා ක්‍රමය කුමක් ද? (ලකුණු 04 යි)

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

## II කොටස

**2.** (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත්වූ මානවයා පිළිබඳ තොරතුරු ලැබෙන ලෙන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ආර්ය සංක්‍රමණිකයන් තම ජනාවාස සඳහා තෝරා ගත් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගංගා නිම්න **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ මෙන් ව්‍යාප්ත වූ ජනගහනයක් මධ්‍යම කඳුකරයේ දක්නට **නොලැබීමට** බලපෑ සාධක **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) ආර්යයන් පසු කාලීනව ජල සම්පාදනය පිළිබඳ අවධානය යොමු කළේ ඇයිදැ'යි කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) A - අභය වැව

B - තිසා වැව

C - මින්නේරිය වැව

කරවන ලද්දේ කවර පාලකයන් විසින් දැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත A, B, C හා D වලින් දැක්වෙන තොරතුරුවලට අදාළ පිළිතුරු වරහනින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

A - කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන යාමට තැනූ ඇළ

B - අඹන් ගඟේ සිට පරාක්‍රම සමුද්‍රයට ජලය ගෙන යාමට තැනූ ඇළ

C - වැවක අතිරික්ත ජලය මුදා හැරීමට කළ තාක්ෂණික නිර්මාණය

D - වැවක ජල පීඩනය සමනය කොට සොරොව්ව වෙත ජලය මුදා හැරීමට කරන ලද නිර්මාණය

(බිසෝ කොටුව, ඇළහැර ඇළ, පිටවාන, ජය ගඟ, අඟමැඩිල්ල ඇළ, රළපනාව, මිනිපේ ඇළ, ඇතුළු වාන) (ලකුණු 04 යි)

(iii) වැව් හා ඇළ නිර්මාණයේදී අතීත වාරිමාර්ග ශිල්පීන් තුළ විෂමතාව යොදා ගත් ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) පොළොන්නරු යුගයෙන් පසුව වාරිමාර්ග නිර්මාණය කෙරෙහි පාලකයන්ගේ උනන්දුව නැති වී යාමට හේතු වූ සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) A - රජුගේ භාණ්ඩාගාරය භාර තැනැත්තා

B - රජුගේ ඡත්‍රය භාර තැනැත්තා

C - රජුගේ මංගල කඩුව භාර තැනැත්තා

හැඳින්වූ නිලනාම අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත A, B, C හා D වලින් දැක්වෙන තොරතුරුවලට අදාළ පුද්ගලයන් අනුපිළිවෙළින් දක්වන්න.

A - පළමුවරට ලංකාවේ ග්‍රාම සීමා නියම කළ රජ

B - මහාවංසයේ සඳහන් අන්දමට දැහැමි පාලනයක් ගෙන ගිය අනුරපුර සොළී රජ

C - මින්නේරි දෙවියන් ලෙස ගෞරවයට පාත්‍ර වූ රජ

D - 'කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත' යන උපාධි නාමයෙන් හැඳින්වූ රජ (ලකුණු 04 යි)

(iii) කුඩාම පාලන ඒකකය වූ ගමක පාලනය සිදුවූ ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) රට වැසියන් රජතුමාගෙන් ඉටු විය යුතු යැයි අපේක්ෂා කළේ කවර සේවාවන්දැයි කරුණු **තුනක්** යටතේ විස්තර කරන්න. (ලකුණු 06 යි)

**5.** (i) පෘතුගීසීන් පැමිණි අවධියේ දී මෙරට පැවැති ප්‍රධාන රාජධානි **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත සඳහන් ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයන් A, B, C හා D අනුපිළිවෙළින් දක්වන්න.

A - ගාල්ලට ගොඩබට පළමු පෘතුගීසි නාවුක කණ්ඩායමේ ප්‍රධානියා

B - ටිකිරි කුමරු නමින් හැඳින්වූ සීතාවක රජතුමා

C - 'ඉඟුරු දී මිරිස් ගත්තා වගේ' යන කියමන හා සම්බන්ධ උඩරට රජතුමා

D - උඩරට අවසාන නායක්කර් වංශික රජතුමා (ලකුණු 04 යි)

(iii) පෘතුගීසීන්ට මෙන් ම ලන්දේසීන්ට ද උඩරට රාජධානිය යටත් කර ගැනීමට නොහැකිවූයේ ඇයිදැයි සාධක **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) වර්ෂ 1815 පමණ වන විට බ්‍රිතාන්‍ය ජාතිකයන්ට උඩරට අල්ලා ගැනීමට හැකිවූයේ ඇයිදැ'යි සාධක **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

6. (i) බ්‍රිතාන්‍යයන් විසින් ඉන්දියාවේ වෙළෙඳ ගබඩා ගොඩ නැංවූ නගර **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) බ්‍රිතාන්‍යයන්ට ශ්‍රී ලංකාව අත්පත් කර ගැනීමට අවශ්‍ය වූ හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iii) වර්ෂ 1848 මෙරට ඇතිවූ බ්‍රිතාන්‍ය විරෝධී අරගලයට කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ බලපෑ ආකාරය සාධක **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) (*a*) මෙරට බෞද්ධ, හින්දු හා ඉස්ලාම් පුනර්ජීවයක් ඇති කර ලීමට මූලිකත්වය ගත් තැනැත්තකු බැගින් පිළිවෙළින් නම් කරන්න.

(*b*) ඉන් ඔබ කැමති එක් තැනැත්තකුගේ සේවාව පිළිබඳ නිදසුන් සහිත කෙටි විස්තරයක් සපයන්න. (ලකුණු 06 යි)

## III කොටස

7. (i) ඉන්දියාව බාහිර ලෝකය සමඟ සම්බන්ධතා පැවැත්වූ එහි වයඹ දිග පිහිටි දුර්ග මාර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත A, B, C හා D යටතේ දැක්වෙන තොරතුරුවලට ගැලපෙන පිළිතුරු වරහනින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

A - ආර්යයන් පැමිණීමට පෙර ඉන්දියාවේ පැවති ශිෂ්ටාචාරය

B - ආර්ය සංක්‍රමණිකයන්ට ඉන්දියාවේ දකුණට ව්‍යාප්ත වීමේදී බාධකයක් වූ කඳු වැටිය

C - ආර්යයන්ගේ නිජ භූමිය ලෙස සැලකෙන ප්‍රදේශය

D - ඉන්දියාව ආක්‍රමණය කළ පළමු ග්‍රීක අධිරාජයා

(වින්ධ්‍යා, නයිල් නිම්න, මහා ඇලෙක්සැන්ඩර්, ස්ටෙප්ස්, ඉරානය, ඇරකන්යෝමා, ඉන්දු නිම්න, සෙලියුකස් නිකේටර්) (ලකුණු 04 යි)

(iii) වෛදික යුගයේ ආර්ථික කටයුතු සංවිධානය වූ ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) අශෝක අධිරාජයාගේ ආගමික සේවාව කරුණු **තුනක්** ඇසුරෙන් පහදන්න. (ලකුණු 06 යි)

8. (i) A - පළමු ලෝක සංග්‍රාම සමයේදී ජර්මන් සබ්මැරීනයක් මගින් ගිල්වා දැමූ ඇමරිකානු මගීන් සිටි නැව

B - පළමු ලෝක සංග්‍රාමයට නායකත්වය දුන් ජර්මන් අධිරාජයා

C - දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු බිහිවූ ජගත් සංවිධානය

අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) (*a*) නාසිවාදයේ දේශපාලන නායකයාද, පැසිස්ට්වාදයේ දේශපාලන නායකයා ද පිළිවෙළින් දක්වන්න.

(*b*) නාසිවාදයේ විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලෝක දේශපාලනයේ ඇතිවූ වෙනස්කම් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) යුද්ධයේදී හැමවිටම සිදු වන්නේ මහත් විනාශයක් බව දෙවන ලෝක සංග්‍රාමය ඇසුරෙන් නිදසුන් ඉදිරිපත් කරමින් පහදන්න. (ලකුණු 06 යි)

9. (i) යටත් විජිත පිහිටුවා ගත් යුරෝපා ජාතීන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත A, B, C හා D යටතේ දක්වා ඇති නව සොයා ගැනීම්වලට සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් නම් කරන්න.

A - ගුරුත්වාකර්ෂණ නියමය

B - දුර දක්නය

C - වාෂ්ප දුම්රිය එන්ජිම

D - දුරකථනය

(ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්, සර් අයිසෙක් නිවුටන්, ගැලීලියෝ ගැලිලි, ජෝර්ජ් ස්ටීවන්සන්, රොබට් ෆුල්ටන්, සැමුවෙල් මෝර්ස්, හම්ප්‍රි ඩේවි, ජෝන් කේ) (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවය නිසා ලොව ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇතිවූ දියුණුව කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවය ලොවට හිතකර මෙන් ම අහිතකර ප්‍රතිඵල ද ගෙන දී ඇති බව නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

[හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**10.** (i) ඉන්දියාවේ ආරම්භ වූ ප්‍රධාන ආගම් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් කරුණට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - ඉස්ලාම් ධර්මයේ ආදි කර්තෘවරයා

B - ඉස්ලාම් ධර්මය ඇතුළත් ශුද්ධ වූ ග්‍රන්ථය

C - ඉන්දියාවේ පළමු මෝගල් පාලකයා

D - ඉන්දියාවේ තුංගභද්‍රා නිම්නයේ ආරම්භ වූ නිදහස් හින්දු රාජ්‍යය

(බහමනි, විජයනගර්, ධම්මපදය, කුරාණය, මහම්මත්තුමා, කලීෆා අබූබකර්, බාබුර්, ජෙහන්ගීර්) (ලකුණු 04 යි)

(iii) මහා අක්බාර් රජ මෝගල් රාජ වංශයේ ශ්‍රේෂ්ඨතම පාලකයා ලෙස සලකනු ලබන්නේ ඇයිදැ'යි කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනයෙන් ඉන්දියාව මුදවා ගැනීමට මහත්මා ගාන්ධිතුමා ගත් ක්‍රියා මාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

***

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

12724

OL/2017/33-STE-II (OLD)

[සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


33 STE II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ඉතිහාසය II
வரலாறு II
History II

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)


විභාග අංකය / சுட்டெண் / Index No. ..........................




[අනෙක් පිටුව බලන්න / மறுபக்கம் பார்க்க / See next page

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)




Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/